# යකැදුරාගේ දියණිය

- ඒ. සී. ජී. එස්. අමරසේකර මහතා විසින් කැන්වසය මත තෙල් සායමෙන් නිර්මාණය කළ සිතුවමකි.
- මෙය දැනට කොළඹ කලාභවනේ නිත්‍ය ප්‍රදර්ශන ශාලාවේ තැන්පත් කර ඇත.
- යුරෝපීය ශාස්ත්‍රාලයීය කලාවේ ආභාසය ඇතිව නිර්මාණය කළ යථාර්ථවාදී සිතුවමකි.
- යකැදුරෙකුගේ දියණියක් මෙම සිතුවමේ මුඛ්‍ය හා එක ම චරිතය වෙයි.
- ඇය, බලි ශාන්තිකර්ම ආදියේ දී යකැදුරන් අඳිනා ආකාරයේ ඇඳුමක් ඇඟලා සිටිය දී, යම් ගුප්ත සිදුවීමක් නිසා බිය පත් වී සිටින්නීය.
- චිත්තාභ්‍යන්තර හැඟීම් ශිල්පියා විසින් යකැදුරු දියණියයේ සියල් සිරුරෙහි අංග වලින් නිරූපණය කර ඇත. (එනම් යකැදුරු දියණියගේ සිතෙහි ඇති වූ බියමුසු හැඟීම ඇයගේ අත්, පා, මුහුණ ආදී සියලු අංග වලින් ප්‍රකාශ කිරීමට ශිල්පියා සමත් වී ඇත.)
- සිතුවමෙහි නිරූපිත එකිනෙක වස්තූන් අතර අන්තර් සබඳතාවක් ඇත.
- ගිනිසිළුවේ ආලෝකය යකැදුරු දියණියගේ මුහුණ හා සිරුර මත මැනවින් පතිත වී ඇති අතර ඉන් උපන් සෙවණැල්ල ඉතා විශාලව ඇය පිටුපස බිත්තියේ සිතුවම් වී ඇත. එම සෙවණැල්ල සිතුවමට බියමුසු ගුඪත්වයක් එක්කර අත.
- ප්‍රේක්ෂකයාට ඍජුව ම දර්ශනය වන බිත්තියේ එල්ලා ඇති වෙස්මුහුණු 3කි. ඒ අතරින් වඩාත් හොඳින් කැපී පෙනෙන වෙස්මුහුණේ ඇත්තේ රෞද්‍ර විලාසයකි. එහෙත් ඒ ආසන්නයේ ම ඇති වෙස්මුහුණු දෙක සහ යකැදුරු දියණියගේ පිටුපස ඇති වෙස්මුහුණ සමච්චල් සිනහවන් සහිත ඒවාය. ඒ යෙදුමේ සියුම් ව්‍යංගාර්ථයක් ඇත.
- මේ සියල්ල සමග ගත් විට සිතුවමේ ප්‍රබල ප්‍රකාශනශීලී ගුණයක් හා නාට්‍යානුසාරී ගති ස්වභාවයක් දක්නට ලැබේ.
- යකැදුරු දියණියගේ රුව පෙරබිමෙහි ස්ථානගතකර තිබේ.
- පසුබිමෙහි ඇති බිත්ති දෙකෙහි හා දොරෙහිත් මැටි බිම්ගඩොළු ඇතිරු(Terra-Cotta floor tile) බිමෙහිත් වර්ණයන් තෝරාගෙන ඇති ආකාරය අනුව යකැදුරු දියණියගේ රුව අවශ්‍ය තරමට ඉස්මතු වී ඇත.
- ආලෝකය හා අඳුර අතර වෙනස මනාව පෙන්වීමේ ශාස්ත්‍රාලයීය ශිල්පක්‍රමය හෙවත් කියුරොස්කුරෝ ශිල්පක්‍රමය මේ සිතුවම සඳහා මැනවින් යොදාගෙන ඇත.
- සිතුවමේ වර්ණමාලාව සංගත වර්ණ මාලාවක ලක්ෂණ ඇති, එහෙත් සපුරාම සංගත නොවන වර්ණ මාලාවකි. එම වර්ණ මාලාවේ ස්වරූපය අනුව එය සම්භාව්‍ය වර්ණ මාලාවක් සේ සඳහන් කළ හැකිය.
- සමස්ත සිතුවමේ ආලෝකය හා අඳුරත්, වර්ණ හා හැඩතල මාලාවත් ඔහු යොදාගෙන ඇත්තේ නිර්මාණය සඳහා ශිල්පියා විසින් තෝරාගෙන ඇති තේමාව වඩාත් හොඳින් තීව්‍ර වන ආකාරයෙනි.

සැකසුම - අමිල කෝසල උඩවත්ත.

Copyright © e-thaksalawa.moe.gov.lk



Copyright © e-thaksalawa.moe.gov.lk